FMM SRI LANKA
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
Free Media Movement

# මාධ්‍ය නිදහස: නිරීක්ෂණ වාර්තාව
## ஊடக சுதந்திரம்: கண்காணிப்பு அறிக்கை
## Media Freedom Rights Monitoring Report

MFRMD

2022 නොවැම්බර්

2 වන වෙළුම - කලාප අංක 11


වෛද්‍ය චමල් සංජීවගේ වැඩ තහනම්!


තරිඳු ජයවර්ධනගෙන් ප්‍රශ්න කරයි



කාත්තා පාගමනට පොලිසියෙන් අවහිර

**මාධ්‍ය නිදහසට අදාළව ඒ ඒ මාසය තුළ වාර්තා වන සිදුවීම්, පූර්ව සිදුවීම්වල වර්ධනයන් හා ඒවාට අදාළ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ. මාධ්‍යවේදීන්ගේ මෙන්ම ජනතාවගේ භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ සිදුවීම්, නව නීති පැනවීම්, නීති ප්‍රතිසංස්කරණ සහ අදාළ ප්‍රස්තුතයන් පිළිබඳව ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පළ වන ප්‍රතිචාර යනාදිය කෙරෙහිද මෙහිදී අවධානය යොමු කෙරේ. මාධ්‍ය නිදහස පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය උපයෝගී කර ගන්නා විෂය පථයට/සංරචකයන්ට අදාළ සිදුවීම් 16ක් 2022 නොවැම්බර් මාසයේදී නිරීක්ෂණය විය. මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව හා සුරක්ෂිතබවට අදාළ සිදුවීම් 09ක්, නීතිමය කොන්දේසි යන සංරචකය යටතට ගැනෙන සිදුවීම් 5ක්, ව්‍යුහාත්මක කොන්දේසි යන සංරචකයට අදාළ සිදුවීම් 01ක් සහ වෘත්තීයවේදීත්වයට අදාළ සිදුවීම් 01ක් ඒ අතර වෙයි.**

## නිරීක්ෂණය වූ සිදුවීම්

1. ජනමාධ්‍ය ඔස්සේ අදහස් ප්‍රකාශ කිරීම හේතුවෙන්, වෛද්‍ය චමල් සංජීවගේ වැඩ තහනම් කිරීම.
2. දැරණියගල මාර්ගයක් පිළිසකර නොකිරීමට විරෝධය පළ කරමින් උද්ඝෝෂණයක නිරත වූ 6 දෙනෙකු අත්අඩංගුවට ගැනීම.
3. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවාගෙන සිටින වසන්ත මුදලිගේ සහ ගල්වැව සිරිධම්ම හිමියන් පිළිබඳ පරීක්ෂණවල ප්‍රගතිය සම්බන්ධ වාර්තා අධිකරණය වෙත ලබා දීම පළමුව ප්‍රතික්ෂේප කළ, ත්‍රස්ත විමර්ශන ඒකකය, පසුව එම වාර්තා අධිකරණයට ඉදිරිපත් කිරීම.
4. උද්ඝෝෂණයක නිරතව සිටියදී පොලිස් නිලධාරීන් අසභ්‍ය වචනයෙන් බැණ වැදී ශාරීරික හිරිහැර සිදු කළ බවට හිටපු පා.ම. හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මානව හිමිකම් කොමිසමට පැමිණිලි කිරීම.
5. විරෝධතා පාගමනක් ආවරණය කරමින් සිටියදී එක්ස්පෝෂර් මාධ්‍යවේදී ෂබීර් මොහොමඩ්ගේ වාර්තාකරණයට බාධා කිරීම.
6. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවාගෙන සිටින වසන්ත මුදලිගේ වෙනුවෙන් ඉදිරිපත් කළ මූලික අයිතිවාසිකම් පෙත්සම විභාගයට ගැනීමට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කිරීම.

7. ෆේස්බුක්හි පළ කළ පෝස්ටුවක් සම්බන්ධයෙන් මාධ්‍යවේදී තරිඳු උඩුවරගෙදර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ප්‍රශ්න කිරීම.

8. සාමකාමී විරෝධතාවකට අයුතු ලෙස අවහිර කිරීම සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් දෙනෙකුට එරෙහිව මාධ්‍යවේදී තරිඳු ජයවර්ධන විසින් පවරන ලද පෞද්ගලික නඩුව විභාගයට නොගෙන ප්‍රතික්ෂේප කිරීම.

9. වසන්ත මුදලිගේ සහ ගල්වැව සිරිධම්ම හිමි නිදහස් කරන ලෙස ඉල්ලා, කාන්තාවන් දෙදෙනෙකු විසින් කළුතර සිට ආරම්භ කරන ලද පා ගමනට පොලිසිය දැඩි ලෙස බාධා කිරීම.

10. පොලිස්පතිවරයා විසින් කරන ලද පැමිණිල්ලක් මත මාධ්‍යවේදී තරිඳු ජයවර්ධන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීම.

11. වසන්ත මුදලිගේ සහ ගල්වැව සිරිධම්ම හිමිට එරෙහිව නගා ඇති ත්‍රස්තවාදී චෝදනා ඉවත් කර ගන්නා ලෙස ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය නිවේදනයක් මගින් ප්‍රකාශ කිරීම.

12. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවාගෙන සිටි ගල්වැව සිරිධම්ම හිමිට අධිකරණය මගින් ඇප නියම කිරීම.

13. නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ජනමාධ්‍යවේදීන් පිළිබඳව සිදු කළ සමීක්ෂණයක වාර්තාව සහ ජනමාධ්‍යවේදීන්ගේ ගවේෂණාත්මක ලිපි ඇතුළත් කෘතියක් එළිදැක්වීම.

14. යුද හමුදාව මුලතිව් මාධ්‍ය සමාජයේ කාර්යාලයට පැමිණ, එම සංවිධානයේ නිලධාරීන්ගේ තොරතුරු ඉල්ලා සිටීම.

15. මඩකලපුවේ මාධ්‍යවේදී එස්. නිලාන්දන්ට ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාසයේ පෙනී සිටින ලෙස දැනුම්දීම.

16. පොලිස් මූලස්ථානයට කළ පැමිණිලි දෙකකට අදාළව, පොලිසිය මාධ්‍යවේදී තරිඳු ජයවර්ධනගෙන් එකම දිනයේ ප්‍රකාශ දෙකක් ලබාගැනීම.

**1 වගුව: වාර්තා වූ සමස්ත සිදුවීම් - 2022 නොවැම්බර්**

| **ආවරණය කර ඇති සංරචකය** | **වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව** |
|---|---|
| ආරක්ෂාව සහ සුරක්ෂිතබව | 09 |
| නීතිමය කොන්දේසි | 05 |
| ව්‍යුහාත්මක කොන්දේසි | 01 |
| වෘත්තීයවේදීත්වය | 01 |
| **එකතුව** | **16** |

## ආරක්ෂාව සහ සුරක්ෂිතබව

**මාධ්‍යවේදීන්ට තම වෘත්තිය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවකින් යුක්තව නිදහස් ලෙස කර ගෙන යෑමේ වාතාවරණයක් පැවතීම ජනමාධ්‍ය නිදහස පිළිබඳ මූලික කොන්දේසියකි. එමෙන්ම ජනමාධ්‍ය නිදහස හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා වීමට නම්, පුරවැසියන්ට අනිටු ප්‍රතිවිපාකවලට මුහුණදීමේ අවදානමකින් තොරව ජනමාධ්‍ය ඔස්සේ හෝ වෙනත් ආකාරවලින් නිදහසේ අදහස් පළ කළ හැකි වාතාවරණයක් පැවතිය යුතුය. සාමාකාමීව රැස්වීමේ, විරෝධය පළ කිරීමේ හා උද්ඝෝෂණවල නිරත වීමේ නිදහසද අදහස් පළ කිරීමේ නිදහසට අයත් වේ. මෙම මූලික නිදහස උල්ලංඝනය වූ අවස්ථා 09ක් නොවැම්බර් මාසයේදී නිරීක්ෂණය විය.**

2 වගුව: 2022 නොවැම්බර්: ආරක්ෂාව සහ සුරක්ෂිතබව - සිදුවීම් 09

| **දර්ශකය** | **වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව** |
|---|---|
| පහරදීම් | 03 |
| මානසික බලපෑම් | 06 |
| **එකතුව** | **09** |

01. **ජනමාධ්‍ය ඔස්සේ අදහස් ප්‍රකාශ කිරීම හේතුවෙන්, වෛද්‍ය චමල් සංජීවගේ වැඩ තහනම් කිරීම.**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ළමා මන්දපෝෂණය පිළිබඳව හිරු රූපවාහිනී නාලිකාවට සහ දෙරණ පුවත්පත, දිවයින පුවත්පත හා The Island පුවත්පත්වලට ප්‍රකාශ ලබා දීම හේතුවෙන් මෙම වැඩ තහනම් කිරීම සිදු කර තිබේ. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරී (පුහුණු) තනතුරෙහි කටයුතු කරන වෛද්‍ය චමල් සංජීව, වෛද්‍ය හා සිවිල් අයිතිවාසිකම් පිළිබඳ වෛද්‍යවරුන්ගේ වෘත්තීය සමිති සම්මේලනයේ (MCPA) සභාපතිවරයාද වෙයි.

මෙම වැඩ තහනමට එරෙහිව නොවැ. 10 වැනිදා මානව හිමිකම් කොමිසම වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළ අතර නොවැ 22 වැනිදා ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කෙරිණි.

මූලාශ්‍ර: https://english.theleader.lk

https://www.youtube.com

02. **උද්ඝෝෂණයක නිරතව සිටියදී පොලිස් නිලධාරීන් අසභ්‍ය වචනයෙන් බැණ වැදී ශාරීරික හිරිහැර සිදු කළ බවට හිටපු පා.ම. හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මානව හිමිකම් කොමිසමට පැමිණිලි කිරීම.**

ආණ්ඩුවේ මර්දනයට එරෙහිව නොවැ. 02 වැනිදා කොළඹදී පැවත්වූ උද්ඝෝෂණයේදී පොලිස් නිලධාරීන් විසින් තමන් ඇතුළු කාන්තාවන්ට අසභ්‍ය වචනයෙන් බැණ වැදී ශාරීරික හිරිහැර සිදු කළ බවට එම පැමිණිල්ලෙන් කියා සිටින අතර, අදාළ සිදුවීම පිළිබඳ වීඩියෝ පට සාක්ෂි වශයෙන් ඉදිරිපත් කර ඇත.

මූලාශ්‍රය: https://dasathalankanews.com

03. **විරෝධතා පාගමනක් ආවරණය කරමින් සිටියදී එක්ස්පෝෂර් මාධ්‍යවේදී ෂබීර් මොහොමඩ්ගේ වාර්තාකරණයට බාධා කිරීම.**

ආණ්ඩුවේ මර්දනකාරී පිළිවෙතට එරෙහිව වෘත්තීය සමිති, බහුජන සංවිධාන හා දේශපාලන පක්ෂවල සහභාගිත්වයෙන් නොවැම්බර් 02 වැනිදා කොළඹදී පැවති පාගමන ආවරණය කරමින් සිටියදී මාධ්‍යවේදිනියක හා සමාජ ක්‍රියාකාරිනියක වන රේඛා නිලුක්ෂි හේරත්ගෙන් මෙම බාධා කිරීම සිදු වී තිබේ. මේ පිළිබඳව ෂබීර් මොහොමඩ් මරදාන පොලිසියට පැමිණිල්ලක් කළ අතර එහිදී දෙපාර්ශ්වයේ එකඟත්වයෙන් සිදුවීම සමථයකට පත් කර ගැනිණි.

මූලාශ්‍ර: 1. FMM- MFRM Desk

2. https://m.facebook.com

04. **ෆේස්බුක්හි පළ කළ පෝස්ටුවක් සම්බන්ධයෙන් මාධ්‍යවේදී තරිඳු උඩුවරගෙදර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ප්‍රශ්න කිරීම.**

ඔක්තෝබර් 09 වැනිදා ගෝල්ෆේස්හි පැවති විරෝධතාවට බාධා කළ පොලිස් නිලධාරීන් හඳුනා ගැනීමට මහජන සහාය පතමින් තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය පළ කළ ෆෙස්බුක් පෝස්ටුවක් සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාසය මගින් මෙම කැඳවීම කර තිබිණි. මේ පිළිබඳව මන්ත්‍රීවරයකු පාර්ලිමේන්තුවේදී විමසූ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් ප්‍රකාශ කළේ, එවැනි ක්‍රියා සිදු කරන මාධ්‍යවේදීන් ඉදිරියේදීත් කැඳවීමට සිදු වන බවයි.

මූලාශ්‍රය: FMM-MFRM Desk

05. **වසන්ත මුදලිගේ සහ ගල්වැව සිරිධම්ම හිමි නිදහස් කරන ලෙස ඉල්ලා, කාන්තාවන් දෙදෙනෙකු විසින් කළුතර සිට ආරම්භ කරන ලද පා ගමනට පොලිසිය දැඩි ලෙස බාධා කිරීම.**

නිරෝෂා ඩැනියෙල් හා ප්‍රියන්ති ප්‍රනාන්දු යන සමාජ ක්‍රියාකාරිනියන් විසින් පැවැත්වූ විරෝධතා පාගමනට ආරම්භයේදීම කළුතර පොලිසියෙන් බාධා කළ අතර පසුව වාද්දුව, පානදුර, මොරටුව යන ස්ථානවලදීද දැඩි ලෙස බාධා කෙරිණි. පාගමනට බාධා කිරීමේ නීතිමය පදනම කුමක්දැයි ප්‍රශ්න කළ එක් කාන්තාවකට පානදුරේදී පොලිසිය පහර දීමත්, එම අවස්ථාවේදීම ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙක් පොලිස් නිලධාරිනියන් දෙදෙනෙකු බෙල්ලෙන් අල්ලා තල්ලු කිරීමත් සමාජයේ දැඩි අප්‍රසාදයට ලක් විය. මෙහිදී අදාළ ක්‍රියාකාරිනියන් දෙදෙනා ඇතුළු 5 දෙනෙකු පානදුර පොලිසිය විසින් (නොවැ. 12දා) අත්අඩංගුවට ගෙන පොලිස් ඇප මත මුදාහැරිණි. කාන්තාවන්ට පහරදීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසම පරීක්ෂණයක් ආරම්භ කර ඇත.

මූලාශ්‍ර: https://www.bbc.com

https://www.youtube.com

06. **පොලිස්පතිවරයා විසින් කරන ලද පැමිණිල්ලක් මත මාධ්‍යවේදී තරිඳු ජයවර්ධන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීම.**

ඔක්තෝබර් 09 වැනිදා ගෝල්ෆේස්හි පැවති විරෝධතාවට බාධා කළ පොලිස් නිලධාරීන් හඳුනා ගැනීමට මහජන සහාය පතමින් තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය පළ කළ ෆෙස්බුක් පෝස්ටුවක් සම්බන්ධයෙන් නොවැ. 13 වැනිදා මෙම ප්‍රශ්න කිරීම සිදු කෙරිණි. එහිදී සයිබර් අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව මාධ්‍යවේදියාගෙන් පැය 4කට ආසන්න කාලයක් දීර්ඝ වශයෙන් ප්‍රශ්න කර තිබේ.

මූලාශ්‍රය: https://www.facebook.com

07. **යුද හමුදාව මුලතිව් මාධ්‍ය සමාජයේ කාර්යාලයට පැමිණ, එම සංවිධානයේ නිලධාරීන්ගේ තොරතුරු ඉල්ලා සිටීම.**

නොවැම්බර් 24 වැනිදා මුලතිව් මාධ්‍ය සමාජයේ කාර්යාල පරිශ්‍රයට ඇතුල් වූ ශ්‍රී ලංකා හමුදාවේ 591 බලසේනාවට අයත් සෙබළුන්, සිය බලසේනාධිපතිවරයාගේ නියෝගය අනුව මාධ්‍ය ආයතනයේ මූලිකයන්ගේ නම් සහ දුරකතන අංක ඇතුළු තොරතුරු ලබාදෙන ලෙස මාධ්‍යවේදී කනපතිපිල්ලෙයි කුමනන්ගෙන් ඉල්ලා ඇත. මාධ්‍යවේදියා එම තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කර තිබේ.

මූලාශ්‍රයඃ https://www.tamilguardian.com

08. **මඩකලපුවේ මාධ්‍යවේදී එස්. නිලාන්දන්ට ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාසයේ පෙනී සිටින ලෙස දැනුම්දීම.**

මඩකලපු දිස්ත්‍රික් දෙමළ මාධ්‍යවේදීන්ගේ සංගමයේ ලේකම් එස්. නිලාන්දන්ගේ තොරතුරු විමසමින්, ඔහු ශ්‍රී ලංකාවට පැමිණි විගස ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාසයේ පෙනී සිටින ලෙස නොවැම්බර් 27 වැනිදා වෙන්කලඩිහි පිහිටි ඔහුගේ නිවසට ගිය පොලිස් නිලධාරීන් දෙදෙනෙකු දැනුම් දී තිබේ. පසුගිය සැප්තැම්බර් 14 වැනිදාද, ඊට පෙර අවස්ථා කිහිපයකදීද පොලිසිය ඔහුගෙන් ප්‍රශ්න කර ඇත.

මූලාශ්‍රයඃ https://twitter.com

09. **පොලිස් මූලස්ථානයට කළ පැමිණිලි දෙකකට අදාළව, පොලිසිය මාධ්‍යවේදී තරිඳු ජයවර්ධනගෙන් එකම දිනයේ ප්‍රකාශ දෙකක් ලබාගැනීම.**

නොවැම්බර් 30 වැනිදා කොළඹ අපරාධ කොට්ඨාසයේ උප පොලිස් පරීක්ෂක ප්‍රේමතිලක සහ කොළඹ දකුණ දිසා 4 බාර සහකාර පොලිස් අධිකාරී සුනෙත් ශාන්ත යන නිලධාරීන්ගේ කැඳවීම දෙමටගොඩ පිහිටි කොළඹ අපරාධ කොට්ඨාසයේදී සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ පිහිටි කොළඹ දකුණ දිසා 4 බාර සහකාර පොලිස් අධිකාරී කාර්යාලයේදී මෙම ප්‍රකාශ ලබාගෙන තිබේ.

පැමිණිල්ලක් කිරීම සඳහා ඔක් 11 වැනිදා කොටුව පොලිසියට ගිය අවස්ථාවේදී එහි ස්ථානාධිපතිගේ නිල කාමරයේදී මාධ්‍යවේදියාට අඩන්තේට්ටම් කිරීම පිළිබඳව සහ ඔක්තෝබර් 9 වැනිදා සාමකාමී උද්ඝෝෂණයකට අයුතු ලෙස බාධා කළ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් දෙදෙනෙකුට එරෙහිව පොලිස් මූලස්ථානයට කළ පැමිණිලි සම්බන්ධයෙන් මෙම කැඳවීම් කර තිබිණි.

මූලාශ්‍රයඃ https://www.facebook.com

---

## නීතිමය කොන්දේසි

**මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි පිළිබඳ සංරචකය යටතට ගැනෙන සිදුවීම් 05ක් නොවැම්බර් මාසය තුළ නිරීක්ෂණය විය. අදහස් පළ කිරීමේ නිදහසට එරෙහිව ආරක්ෂක අංශවල ක්‍රියාකාරීත්වය මෙන්ම, එම නිදහස ආරක්ෂා වන ආකාරයේ නීතිමය මැදිහත්වීම්ද ඒ අතර වෙයි.**

**3 වගුවඃ 2022 නොවැම්බර්ඃ නීතිමය කොන්දේසි - සිදුවීම් 05**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| නීතිමය ක්‍රියාමාර්ග | 05 |
| **එකතුව** | **05** |

01. **දැරණියගල මාර්ගයක් පිළිසකර නොකිරීමට විරෝධය පළ කරමින් උද්ඝෝෂණයක නිරත වූ 6 දෙනෙකු අත්අඩංගුවට ගැනීම.**

දිගු කලකින් පිළිසකර නොකළ දැරණියගල-පොල්ග ස්වත්ත මාර්ගය පිළිසකර කර දෙන ලෙස ඉල්ලා ප්‍රදේශවාසීන් පැවැත්වූ උද්ඝෝෂණයක් අතරතුර මෙම පිරිස අත්අඩංගුවට ගෙන ඇත.

මූලාශ්‍රයඃ https://www.facebook.com

02. **ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවාගෙන සිටින වසන්ත මුදලිගේ සහ ගල්වැව සිරිධම්ම හිමියන් පිළිබඳ පරීක්ෂණවල ප්‍රගතිය සම්බන්ධ වාර්තා අධිකරණය වෙත ලබා දීම පළමුව ප්‍රතික්ෂේප කළ, ත්‍රස්ත විමර්ශන ඒකකය, පසුව එම වාර්තා අධිකරණයට ඉදිරිපත් කිරීම.**

මෙම ශිෂ්‍ය ක්‍රියාකාරිකයන් සම්බන්ධ නඩුව නොවැම්බර් 4 වැනිදා තංගල්ල මහේස්ත්‍රාත් අධිකරණයේදී කැඳවනු ලැබූ අතර, ත්‍රස්ත විමර්ශන ඒකකය වෙනුවෙන් නඩුවට පෙනී සිටි නිලධාරීන් ප්‍රකාශ කළේ ත්‍රස්තවාදය

වැළැක්වීමේ පනත යටතේ රඳවා සිටින සැකකරුවන් සම්බන්ධ වාර්තා අධිකරණයට ලබා දීමට ඔවුන් බැඳී නොමැති බවයි. අදාළ පරීක්ෂණවල ප්‍රගතිය සහ සාක්ෂි සම්පිණ්ඩන අධිකරණයට ඉදිරිපත් කරන ලෙස ඊට පෙර නඩුවාරයේදී ත්‍රස්ත විමර්ශන ඒකකයට මහේස්ත්‍රාත්වරයා නියෝග කර තිබිණි.[1]

රැඳවියන් වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ උපාලි මොහොට්ටි අධිකරණයට ප්‍රකාශ කර සිටියේ ත්‍රස්තවාදය වැළැක්වීම පනත යටතේ යම් යම් වරප්‍රසාද විමර්ශන නිලධාරීන්ට ලබා දී තිබුණද අපරාධ නඩු විධාන සංග්‍රහ පනත යටතේ පරීක්ෂණයක ප්‍රගතිය වාර්තා කිරීම සහ වැඩිදුර වාර්තා මගින් සාක්ෂි සම්පිණ්ඩන ඉදිරිපත් කිරීමට ඇති අවශ්‍යතාවලින් විමර්ශන නිලධාරීන්ට බැහැර විය නොහැකි බවයි.

එම නඩුව නොවැම්බර් 25 වැනිදා යළි කැඳවූ අවස්ථාවේදී ත්‍රස්ත විමර්ශන ඒකකයේ නිලධාරීන් ප්‍රකාශ කළේ අදාළ වාර්තා කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇති බවයි. ඒ අනුව තංගල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ පැවති නඩුව අවසන් කෙරිණි.[2]

මූලාශ්‍ර 1. FMM-MFRM Desk

2. https://www.youtube.com

03. **ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවාගෙන සිටින වසන්ත මුදලිගේ වෙනුවෙන් ඉදිරිපත් කළ මූලික අයිතිවාසිකම් පෙත්සම විභාගයට ගැනීමට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කිරීම.**

නොවැම්බර් 10 වැනිදා මෙම තීරණය ලබා දුන් ශ්‍රේෂ්ඨාධිකරණය, වසන්ත මුදලිගේ මහේස්ත්‍රාත්වරයකු හමුවට පමුණුවන ලෙසත්, ඔහු අධිකරණ වෛද්‍ය නිලධාරියා හමුවට පමුණුවා සම්පූර්ණ වාර්තාවක් කැඳවීමට පියවර ගන්නා ලෙසත් වැඩිදුරටත් නියෝග කළේය.

විජිත් මලල්ගොඩ සහ එස්.තුරෙයිරාජා යන මහත්වරුන්ගෙන් සමන්විත ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ල හමුවේ මෙම පෙත්සම විභාගයට ගැනෙන අතර පෙත්සම්කරු වෙනුවෙන් ජනාධිපති නීතිඥ සාලිය පීරිස් පෙනී සිටී. ජනවාරි 31 වැනිදා පෙත්සම යළි කැඳවීමට නියමිතය.

ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝග පරිදි නොවැම්බර් 14වැනිදා වසන්ත මුදලිගේ තංගල්ල මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලදි.

මූලාශ්‍රය: https://sinhala.adaderana.lk

04. **ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවාගෙන සිටි ගල්වැව සිරිධම්ම හිමිට අධිකරණය මගින් ඇප නියම කිරීම.**

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවාගෙන සිට, පසුව රක්ෂිත බන්ධනාගාර ගත කර සිටි සිරිධම්ම හිමියන්, නොවැම්බර් 22 වැනිදා කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය විසින් දැඩි කොන්දේසි සහිතව ඇප මත මුදාහැරිණි.

ඒ අනුව සිරිධම්ම හිමියන්ට රුපියල් ලක්ෂ 5 බැගින් වූ ශරීර ඇප දෙකක් නියම කෙරුණු අතර එම හිමියන්ගේ විදේශ ගමන් තහනම් කිරීමටද සෑම මසකම අවසන් ඉරු දින ත්‍රස්ත මර්දන කාර්යාංශයට වාර්තා කළ යුතු බවටද නියෝග කෙරිණි. නඩුව සම්බන්ධයෙන් ප්‍රකාශ නිකුත් කිරීමෙන් හා නඩු කටයුත්ත පැවැත්වෙන කාලසීමාව තුළ ප්‍රචණ්ඩ කටයුතුවල යෙදීමෙන් වැළකීමද ඇප කොන්දේසි වේ. දෙසැම්බර් 12 වන දා නඩුව යළි කැඳවීමට නියමිතය.

මූලාශ්‍රය: https://sinhala.adaderana.lk

05. **සාමකාමී විරෝධතාවකට අයුතු ලෙස අවහිර කිරීම සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් දෙනෙකුට එරෙහිව මාධ්‍යවේදී තරිඳු ජයවර්ධන විසින් පවරන ලද පෞද්ගලික නඩුව විභාගයට නොගෙන ප්‍රතික්ෂේප කිරීම.**

ඔක්තෝබර් 10 වැනිදා ගාලු මුවදොරදී පැවති විරෝධතාවට බාධා කිරීම සම්බන්ධයෙන් සහකාර පොලිස් අධිකාරී නලින් දිල්රුක් සහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී රොෂාන් ඩයස් යන නිලධාරීන්ට එරෙහිව මෙම නඩුව පවරා තිබුණු අතර ඔක්. 21 වැනිදා කොටුව මහේස්ත්‍රාත්වරයා එම නිලධාරීන්ට නොතීසි නිකුත් කළේය. එහෙත් පැමිණිලි පාර්ශ්වයට නොදන්වා, නීතිපතිවරයා ඉදිරිපත් කළ මෝසමක් මගින් නොවැම්බර් 01 වැනිදා එම නඩුව කැඳවූ අවස්ථාවේ එම නොතීසි අවලංගු කෙරිණි. පසුදා පැමිණිලි පාර්ශ්වය වෙනුවෙන් ජනාධිපති නීතිඥ සාලිය පීරිස් අධිකරණය හමුවේ එම ක්‍රියාමාර්ගය පිළිබඳව විරෝධය පළ කළේය. නඩුව නොවැම්බර් 08 වැනිදා යළි කැඳවූ අවස්ථාවේ දෙපාර්ශ්වය විසින්ම දීර්ඝ වශයෙන් කරුණු දැක්වූ අතර නොවැම්බර් 25 වැනිදා, නඩුව විභාගයට නොගෙන ප්‍රතික්ෂේප කිරීමේ තීන්දුව ප්‍රකාශයට පත් කෙරිණි. මෙම තීන්දුවට එරෙහිව මහාධිකරණය හමුවේ අභියාචනයක් ගොනු කරන බව පැමිණිලි පාර්ශ්වය ප්‍රකාශ කරයි.

මූලාශ්‍ර: 1. https://srilankabrief.org

2. https://www.facebook.com

3. https://www.facebook.com

## ව්‍යුහාත්මක කොන්දේසි

**මාධ්‍ය පද්ධතියේ සමස්ත ව්‍යුහයට මෙන්ම මාධ්‍ය නිදහස සක්‍රිය කරන සමස්ත පරිසරයට අදාළ වන විභව දර්ශක 6ක් මෙම මානයට ඇතුළත්ය. ඒ අතරින් 'අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය' යන දර්ශකයට අයත් වන එක් සිදුවීමක් මෙහි ඇතුළත් වේ. මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව හා නීතිමය කොන්දේසි යන සංරචක යටතේ ඉදිරිපත් කර ඇති විශේෂ සිදුවීම් සම්බන්ධයෙන් මානව හිමිකම් ආරක්ෂකයින් කළ මැදිහත්වීම් රැසක් මෙම දර්ශකයට අදාළ වුවද ප්‍රායෝගික තත්ත්වය අනුව ඒ සියල්ල මෙහි වෙනම සඳහන් කර නොමැත.**

**4 වගුව: 2022 නොවැම්බර්: ව්‍යුහාත්මක කොන්දේසි - සිදුවීම් 02**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය | 01 |
| **එකතුව** | **01** |

01. **වසන්ත මුදලිගේ සහ ගල්වැව සිරිධම්ම හිමිට එරෙහිව නගා ඇති ත්‍රස්තවාදී චෝදනා ඉවත් කර ගන්නා ලෙස ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය නිවේදනයක් මගින් ප්‍රකාශ කිරීම.**

    ඔවුන්ට එරෙහිව නගා ඇති පදනම් විරහිත ත්‍රස්තවාදී චෝදනා වහා ඉවත් කළ යුතු බවත්, ඔවුන් දෙදෙනා සම්බන්ධයෙන් රැඳවුම් නියෝග දීර්ඝ කිරීම නතර කළ යුතු බවත් එම සංවිධානය කියා සිටී.

    ත්‍රස්ත විරෝධී චෝදනා යටතේ විරෝධතාකරුවන් රඳවා තබාගැනීම ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහ සිවිල් දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය මගින් සහතික කර ඇති අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ සාමකාමීව රැස්වීමේ අයිතිය පැහැදිලිවම උල්ලංඝනය කිරීමක් බව කියා සිටින එම සංවිධානය, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවලංගු කිරීමට පියවර ගත යුතු බවද අවධාරණය කරයි.

    මූලාශ්‍රය: https://www.amnesty.org

---

## වෘත්තීයවේදීත්වය

**වෘත්තීයවේදීත්වය යන සංරචකය යටතට, මාධ්‍යවේදීන්ට හොඳ අධ්‍යාපනයක් තිබීම, මාධ්‍යවේදීන්ගේ සේවා කොන්දේසි, මාධ්‍යවේදීන් කර්තෘමණ්ඩල හා ජාත්‍යන්තර මාර්ගෝපදේශ භාවිතය, ස්වයං වාරණය, වෘත්තීය සමිති හා සංගම් මගින් මාධ්‍යවේදියාගේ ස්වාධිපත්‍යය, තමන්ගේ කාර්යභාරය පිළිබඳව මාධ්‍යවේදියාගේ අවබෝධය, මාධ්‍ය වෘත්තියට ඇති පිළිගැනීම යන දර්ශක ඇතුළත් වේ. ඒ යටතට ගැනෙන එක් ක්‍රියාකාරකමක් නොවැම්බර් මාසයේදී සිදු කෙරිණි.**

**5 වගුව: 2022 නොවැම්බර්: වෘත්තීයවේදීත්වය - සිදුවීම් 01**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| මාධ්‍යවේදීන්ගේ සේවා කොන්දේසි/තමන්ගේ කාර්යභාරය පිළිබඳව මාධ්‍යවේදියාගේ අවබෝධය/මාධ්‍ය වෘත්තියට ඇති පිළිගැනීම | 01 |
| **එකතුව** | **01** |

01. **නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ජනමාධ්‍යවේදීන් පිළිබඳව සිදු කළ සමීක්ෂණයක වාර්තාව සහ ජනමාධ්‍යවේදීන්ගේ ගවේෂණාත්මක ලිපි ඇතුළත් කෘතියක් එළිදැක්වීම.**

    මාධ්‍යවේදීන්ගේ වෘත්තීය අයිතීන් හා ගැටලු පිළිබඳව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සිදු කළ සමීක්ෂණයේ වාර්තාව සහ මහජන සේවා වටිනාකම් සහ ගවේෂණාත්මක වාර්තාකරණ ප්‍රවර්ධන වැඩසටහන යටතේ සමස්ත දිවයිනම ආවරණය වන පරිදි තෝරාගත් මාධ්‍යවේදීන් විසින් සම්පාදනය කරන ලද ගවේෂණාත්මක ලිපි සංග්‍රහය මෙසේ එළිදැක්විණි. ඒ සඳහා වූ සම්මන්ත්‍රණය නොවැම්බර් 24 වැනිදා කොළඹ ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලයේදී පැවැත්විණි.

    මූලාශ්‍රය: FMM-MFRM Desk

**6 වගුව: මාධ්‍ය නිදහස: 2022 ජනවාරි - නොවැම්බර් දක්වා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත වාර්තා වී ඇති සිදුවීම්.**

| **ආවරණය කර ඇති සංරචකය** | **2022 ජනවාරි-ඔක්තෝබර්** | | **2022 නොවැම්බර්** |
|---|---|---|---|
| | නව සිදුවීම් | පෙර සිදුවීම්වල වර්ධනයන් | |
| ආරක්ෂාව හා සුරක්ෂිතබව | 55 | | 09 |
| නීතිමය කොන්දේසි | 97 | 23 | 05 |
| මාධ්‍යයේ ස්වාධීත්වය | 06 | | - |
| වෘත්තීයවේදීත්වය | 06 | | 01 |
| ව්‍යුහාත්මක කොන්දේසි | 16 | 01 | 01 |
| **එකතුව** | **180** | **24** | **16** |

2022 මාධ්‍ය නිදහස මාසික වාර්තාව ජනවාරි-ඔක්තෝබර් මෙතැනින් බලන්න

**පසුසටහන:** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ටද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය, දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවි සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවක් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම මාසික වාර්තා පිළියෙල කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩිදුර තොරතුරු සොයා එම සිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදි නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරුම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.

Free Media Movement

Convener: Lasantha De Silva +94 71 166 7938, +94 77 810 7620 | Secretary: Hana Ibrahim +94 77 741 2995

Treasurer: Ananda Jayasekara +94 77 312 4850

No 96, Bernard Soysa Mw, Colombo 05. Tel: +94 112368895 Fax: +94 112368895;

Web: www.fmmsrilanka.lk, www.mediareform.lk

Email: fmmsrilanka@gmail.com | Facebook: https://www.facebook.com/fmm.srilanka

Twitter: https://twitter.com/FMMsrilanka | #FMM25

Layout: Nalinda Seneviratne